ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

Phone **: 02074289388**
Fax **: 08719005163**
E-mail **: lanka.viththi @ virgin.net**

කර්තෘ : *දයා ආනන්ද රණසිංහ*
Editor **: Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
Art : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
Computer Graphics : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
Photography : Ananda Kariyawasam



අපි මිත්‍රයින් යහළුවන් ගැන නිතර කතාකරන්නෙමු. අපේ ජීවිතයේ පටන්ගැන්මේ සිට අවසානය දක්වාම යම් යම් ප්‍රමාණයෙන් සම්බන්ධවී සිටින ඔව්හු අපේ දුකේදිත් සැපේදිත් පංගුකාරයෝ වී සිටිති.

හොඳ යහළුවෙක් හෙවත් උතුම් අවංක යහළුවෙක් වීමේ ආනිශංස දක්වමින් බුදුරජාණන් වහන්සේ කාරණා දහයක් අඩංගු පිරිතක් දේශනා කළ සේක. එහි නම මිත්තානිසංස පිරිතයි. පහත දැක්වෙන්නේ එයයි. හොඳ මිත්‍රයින් ලබන්නට නම් ඊට හොඳම පියවර ඔබ ද හොඳ මිතුරෙකු වීමයි.

හොඳ මිතුයෙකු වීමේ ආනිශංස පහදාදෙන

මිත්තානිසංස පිරිත

යම් පුද්ගලයෙක් මිත්‍ර දෝහී නොවේ නම් .....

1. හෙතෙම තමාගේ ගෙයින් බැහැරව යම් තැනකට ගියේ නම් බොහෝ මිහිරි ආහාර පාන ලබයි. බොහෝ දෙනෙක් ඔහුගේ ඇසුර ලැබීමට කැමති වෙති.

2. ඔහු යම් රටකට ගියේද, යම් නුවරකට ගියේද, ඒ සෑම තන්හිම පුද සත්කාර ලබයි.

3. ඔහුට සොරු ළං නොවෙති. රජ තෙමේ අවමන් නොකරයි. ඔහු හැම සතුරන්ම මැඩ පවත්වන්නේය.

4. හෙතෙම නොගැටුණු සිත් ඇතිව තමාගේ ගෙට එයි. උතුම් මිත්‍රයාගේ අපමණ වූ ගුණ සහාවෙහි පවා කියති. හෙතෙම නැයින්ට උතුම් වේ.

5. හෙතෙම අනුනට සත්කාර කරන්නේ, අනුන්ගේ සත්කාර ලබන්නෙක්ද වෙයි. අනුන් කෙරෙහි ගෞරව සහිත වූයේ ඔවුන් විසින් ගරු කරනු ලබන්නේද වෙයි. ලෝකයා ඔහුගේ ගුණ වැනුම හා යසස උසස් කොට නගාලන්නේද වෙයි.

6. මිත්‍රයන් පුදන තැනැත්තා ඔවුන් විසින් ද පුදනු ලබන්නේ වෙයි. බුද්ධාදී කල්‍යාණ මිත්‍රයින්ට වඳින තැනැත්තා තෙමේද වැඳුම් ලබන්නෙක් වෙයි. හෙතෙම කීර්තියට පැමිණේ.

7. හෙතෙම දිලිසෙන ගිනි මෙන් යස ඉසුරු, පිරිවර සැපතින් උජ්වලිත වෙයි. දෙවියෙකු මෙන් බබලයි. ශ්‍රියා කාන්තාව විසින් අත් නොහරින ලද්දේ වෙයි.

8. ගවයෝ ඔහුට ඵල ප්‍රයෝජන දෙති. ක්ෂෙත්‍රයෙහි වපුල තාක් පැල හට ගනී. දරු සැප වළඳයි.

9. දැදුරෙන්, පර්වතයෙන්, ගසෙන් හෝ යමකින් ගිළිහුණේ නම් පිහිට ලබයි.

10. වැඩුණු මුල් හා නුග අරළු ඇති නුග රුකක් සොළවා ඵලන්නට නොහැක්කා සේ ඔහු මඩනට කිසිවිටෙක සතුරන්ට නොහැක්කේය.

ලියා එව්වේ
♦ *පැරකුම්*
ප්‍රසන්න ජයතිලක
Northolt, Middx, UK

❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

හිතොපදේශයෙන්

අර්ත්ථාතුරාණං න ගුරුර් න බන්ධුර්
විද්‍යාතුරාණං න සුඛං න නිද්‍රා
කාමාතුරාණං න භයං න ලජ්ජා
ක්ෂුදාතුරාණං න රුචිර් න පත්ථ්‍යා

අර්ථය **: වස්තු රැස්කිරීමෙහි නියුක්ත වූවාහු ගුරුවරුන් හා ඥාතීන් නොලබන්නෝය. විද්‍යාව සොයා යන්නාහු සැපය හා නිද්‍රාව දුරුකරන්නෝය. කාමයෙන් පීඩිත වූවාහු භය හා ලැජ්ජාව නසන්නෝය. ක්ෂුධාවෙන් පීඩිත වූවාහු අභිරුචිය හා පථ්‍යය නොබලන්නෝය.**

මිනිසුන්ගේ සාමාන්‍ය ක්‍රියාකාරකම් 4 ක් ගැන මෙම පද්‍යයෙන් විස්තර කර ඇත. ඉන් පළමුවැන්න නම් වස්තු රැස්කිරීමෙහි නිපුන් වූවන් ගුරුවරුන් හා ඥාතීන් නොලබන බවයි. මෙම පද්‍යය රචනා වූ කාලයේ එය එසේ වුවද වත්මන් සමාජය දෙස බලන විට ගුරුවරුන් හා ඥාතීන් පමණක් නොව වස්තු රැස්කිරීමේ යෙදෙන්නන් තම දෙමාපියන් ඇතුළු අඹුදරුවන් පවා අමතක කර දමනු ඇත.

මෙලොව ඇති බාහිර සම්පත් සදාකාලික ඒවා නොවේ. අපට ඒවා හැමදා පරිහරණය කළ නොහැකිය. හේතුව අපද සදාකාලික නොවන බැවිනි. එනිසා ජීවිත කාලය පුරාම රැස්කර නොඉඳ ජීවත්වන කාලයට ප්‍රමාණවත් ලෙස භුක්ති විඳීමට සපයාගැන්ම ඥානාන්විතය. නොඑසේ නම් හැමදාම නොලැබෙන දේ ගැන සිතා දුක්වීමට පසුතැවීමට සිදුවේ.

ඒ වගේම, කෙනෙක් අනුන්ගේ දේ බෙදාගැනීමට සිතන්නේ නම් එයින් පෙනෙන්නේ ඔහු ඒ ගැන ගිජුවී ඇති බවයි. අපොහොසත් තම අසල්වැසි ඥාතියා අමතක කර, යොදුන් ගණන් දුර පොහොසත් නැයා සොයා ඔබ යනු ඇතැයි කියමනක්ද තිබේ. ඒ ගිජුකමේ ස්වභාවයයි. ඒ නිසා ධන තණ්හාවෙන් වෙළුණු පුද්ගලයාට ඥාතීන් ද මිතුරන් ද ගුරුවරු දෙමාපිය අඹුදරුවන් ද නැත.

මෙහි එන දෙවන කාරණය නම් ශිල්ප ශාස්ත්‍ර හදාරන්නන් එමගින් සිය සැපත හා නින්ද දුරුකරගන්නා බවයි. අධික ලෙස මහන්සි වී අධ්‍යාපනාදී කටයුතු කරන් නන්ට තම සුව පහසුව පිළිබඳව මූලිකව සිතන්නට ගිය හොත් තම අභිමතාර්ථය කෙරෙහි යා නොහැකිය. විනෝ දයට බරව අලසව කටයුතු කිරීමෙන් ශාස්ත්‍රීය කටයුතු පම ණක් නොව අනෙක් කටයුතුද අඩාල වනු නොඅනුමානය.

කාමාතුරයන්ගේ හෙවත් කාමයෙහි ලොල් වූවන්ගෙන් ඉවත්ව යන කාරණා දෙකක් ගැන තෙවනුව මෙහි සඳහන් කොට තිබේ. ඒ ලැජ්ජාව හා බයයි. මෙම දෙක ලෝක පාලක ධර්ම දෙක ලෙස ධර්මයේ සඳහන් කරයි. ඒවා නැත්තාට මෙලොව කළ නොහැකි පහත් දෙයක් නැත. ඔහු බිහිසුණු අපරාධ කරන්නට පෙළඹේ. කාමය මුවහතක තැවරූ පැණි මෙනැයි කියති. පැණි දිව පිනවන ඉතා මධුර දෙයක් වුවත් එය කෑම ඉතා පරිස්සමෙන් කළ යුත්තකි. මෙහි ලා වැදගත් වන්නේ කාමයෙහි අන්තගාමී නොවීමයි.

අවසාන කරුණ ලෙස සඳහන් කරන් නේ බඩසයින් පෙලෙන්නන් ආහාරයේ ඇති රස හා ගුණාගුණ නොබලා බඩගිනි නිවාගැනීමට ලැබෙන දෑ ආහාරයට ගැනීමයි. ඒ රස හා ගුණ සෙවීමට ගියහොත් බඩගින්න තීව්‍රවන බැවිනි.

එදිනෙදා ජීවිතය අපට කරදර වලි න් තොරව ගතකළ නොහැකිය. හොඳම දේ නම් ඒවා ඥාණාන්විතව විසඳා ගැනීමයි. අප ඉගෙනගත යුත්තේ ලොකු ප්‍රශ්නයක් පොඩි එකක් කරගැන්මටත්, පොඩි ප්‍රශ්නයක් නැතිකර ගැනීමටත්ය. අපට අම්හිරි දෙයක් ඇසුනොත් එය යළි යළිත් සිහි නොකළ යුතුවා මෙන්ම මිහිරි යමක් ඇසුනොත් එය යළි යළි සිහිපත් කළ යුතු බවත්ය. වැරීම සාමාන්‍ය දෙයකි. නමුත් ඉන් නැගිටීමට අධිෂ්ඨාන කරගත යුතුය. ලැබූ නව වසරේ අප හැම සිහියට ගත යුතු කාරණය ද එයයි.

♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි
ලන්ඩන් බෞද්ධ විහාරය
London Buddhist Viharaya
The Avenue, London W4

මතට තිත ?

ශ්‍රීලංකාවේ මත්පැන් පානය සහ අළෙවිය ඉතා අධික ලෙස ගතවූ පස් අවුරුද්ද තුළ **(2006 - 2010)** වැඩිවී ඇති සැටි රජයේ ජාතික විෂ මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලය විසින් (National Dangerous Drugs Control Board) නිකුත්කරන ලද වාර්තාවකින් පෙන්නාදෙයි.

මෙම මණ්ඩලයේ ලේකම්වරයා ඉහතකි කාරණය රූප සටහන් සහ සංඛ්‍යාලේඛණ මගින් සවිස්තරව මාධ්‍ය අංශයන්ට අනාවරණය කළේය. අවුරුද්දකට මත්පැන් වර්ග ලංකාවේ විකිණෙන්නේ ලීටර් දසලක්ෂ ගණනිනි. අවුරුද්දෙන් අවුරුද්ද එම ප්‍රමාණය වැඩිවූවා මිස යාන්තමින් හෝ අඩුවූ බවක් නෙපෙනේ. ලංකාව වැනි රටකට මේ තත්වය කිසිසේත් ඔරොත්තු දෙන්නක් නොවේ. ඉහතකි විෂ මත් ද්‍රව්‍ය පාලක මණ්ඩලය අයත් වන්නේ රාජ්‍ය ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට අයත් ආරක්ෂක අමාත්‍යංශය යටතටය. එබැවින් මේ කාරණා රජයේ ඉහළ තැන් නොදන්නවා යයි කියන්නටද බැරි ය.

"මම මත්පැනෙන් වළකිමි" යි දිනපතා පන් සිල් ගනිද්දී පොරොන්දුවන ජනතාවකට මත්පැන් අධික ලෙස බොන්නට සළස්වා ඔවුන් පරිහානියට පත්කරවා ඒමගින් ලාබ ලැබීම යහපත් කටයුත්තක් ලෙස නොව, නිහීන ක්‍රියාවක් ලෙස පිළිකුලෙන් යුතුව සැලකිය යුතු දෙයකි. මත්පැන් නිසා ලංකාවේ පවුල් අවුල් වී, කසාද කැඩී දුක්ඛිත තත්වයට පත්වන ප්‍රමාණය දිනෙන් දිනම වැඩිවේ. ඒ පවුල් වල දරුවන්ට හරි ආහාරයක්, අධ්‍යාපනයක් නොලැබේ. ඔවුන්ට අනාගතයක් නැත.

මත්පැනට ඇබ්බැහිවීම හේතුකොට ගෙන මිනිස්සු රැකියාව අහිමිකර ගනිති. අක්මාවේ රෝග, හෘද රෝග හටගෙන බොහෝ තරුණයෝ මැඳි වයසටත් පෙරාතුව මියයති. මේ සියල්ල මහා පරිමාණයෙන් මෙසේ වෙද්දී අතීතයේ සිට මේ දක්වාම රට කරවන සියළුම නායකයන් ගෙනගියේ දෙබිඩි පිළිවෙතකි. මහා ප්‍රෝඩාවකි. එනම් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිකරනවාය රට සෞභාග්‍යය කරා ගෙනයන වාය කියමින් ජනතාව මත්පැනට සහ දුම්පානයට පොළඹවා ලැබෙන ආදායමෙන් රජයේ අයවැය පරතරයන් පියවාගැනීම ය.

මේ රජයේ ජනාධිපතිවරයාද සෞභාග්‍යය කරා රට ගෙනයන්නට වැඩපිළිවෙලක් දියත් කරමින් එයට **මහින්ද චින්තනය** යයි නම් තැබීය. එය ඉතා හොඳ යෝජනාවලියක් ලෙස ජනතාව දුටුවෝය. එහි එක යෝජනාවක් නම් **මතට තිත** හෙවත් මත්පැන් හා මත් බෙහෙත් භාවිතයට නැවතීමේ ලකුණ තැබීම ය. එම **තිත** ගැන කතා කර දැනට අවුරුදු කිපයක් ම ගතවුණත් එය නිකම්ම නිකම් සෝබන වචන දෙකක් පමණක් බව ඉහතින් දැක්වූ සංඛ්‍යා ලේඛණ වාර්තාවෙන් මනාව වැටහේ.

අධ්‍යාත්මික වශයෙන් රටේ ජනතාව යහ මගට ගන්නට සුරාවේ ආදීනව කියාදෙමින් ආගමික නායකයන් කොතෙක් උත්සාහ කළත් එම රටේ රජය මහා පරිමාණයෙන් මත්පැන් අළෙවිකරමින් සුරාව අද දියුණුවේ සංකේතය බව රටවැසියාට අඟවනවා නම් ඒ රටට විනාශය මිස සෞභාග්‍යයක් කොහේද?

The consumption of alcohol has drastically increased in Sri Lanka over the five year period of 2006 - 2010.
ශ්‍රීලංකාව තුළ වසරකට බොන මත්පැන් වර්ග සහ බොන ප්‍රමාණයන්. 2011 වන විට ප්‍රමාණය වැඩිවූ සැටි !

	2006	2010
Arrack	67.1 million litres	75.2 million litres
Bottled Toddy	10.5 million litres	16 million litres
Beer & Stout	51.9 million litres	66.9 million litres
Wines	375,739 litres	395,892 litres
Whisky	240,008 litres	542,776 litres
Brandy	1.98 mn litres	2.5 mn litres
Gin	1.2 mn litres	1.9 mn litres
Rum	543,572 litres	804,008 litres
Vodka	111,551 litres	236,609 litres

(Source: National Dangerous Drugs Control Board - Sri Lanka)

NORMA & Co
Associate Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

Colombo Office
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632